**පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන සඳහා පුහුණුකරුවන් (TOT) හා**

**පේෂකර්මාන්ත අත්යන්ත්‍ර සේවකයින් බඳවා ගැනිම**

**ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත.**

- නැගෙනහිර පළාත් ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානවල පවතින පුහුණු උපදේශකවරුන්ගේ පුරප්පාඩු සඳහා ස්ථිර වශයෙන් පත්කිරීම් කරනු ලබන අතර, ................................................................................. දක්වා තාවකාලික පදනම මත සේවය කිරිම සඳහා පුහුණුකරුවන් (Trainers Of Trainees – TOT)ඉ බඳවා ගැනීමටත්, පේෂකර්මාන්ත මධ්‍යස්ථාන වලට කෑලි පදනම මත කුලි ගෙවීමේ ක්‍රමය යටතේ සේවය කිරිම සඳහා විවින්කරුවන් බඳවා ගැනීමටත් ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව තිරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය තම ඉල්ලුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ හැක.

පහත සඳහන් සුදුසුකම් ලබා ඇති සියලු දෙනාම පුහුණුකරුවන් ලෙස කටයුතු කිරිම සඳහා තම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ හැක.

01. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් - පුහුණුකරුවන් (TOT)

- අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සිංහල/දෙමළ/ ඉංග්‍රිසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයන් දෙකකට සම්මාන සමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් සමත්වී තිබිම.

සහ

- අ.පො.ස. (උ/පෙළ) විභාගය අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය විභාගය හැර ) සමත්වී තිබිම.

සහ

**වෘත්තිය සුදුසුකම්,** පුහුණුකරුවන් (TOT)

- රජයේ පිළිගත් පේෂකර්මාන්ත ආයතනයකින් අත් යන්ත්‍රයෙන් රෙදි විවීම පිළිබඳව දෑ අවුරුදු (02) පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබිම.

හෝ

- රජයේ පිළිගත් පේෂකර්මාන්ත ආයතනයකින් අත් යන්ත්‍රයෙන් රෙදි විවීම පිළිබඳව එක් අවුරුදු (01) පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබිම.

  හෝ

- නැගෙනහිර පළාත් ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පුහුණු මධ්‍යස්ථානවල එක් අවුරුද්දකට නොඅඩු කාලසීමාවක් පුහුණුකරුවකු ලෙස සාර්ථක සේවාවක් ඉටු කර තිබීම.

02. **අවශ්‍ය සුදුසුකම් - රෙදි වියන්නන් / පේෂකර්මාන්ත සේවකයින්.**

ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පේෂකර්මාන්ත මධ්‍යස්ථානවල සේවය කර ඇති / පුහුණුව ලබා ඇති හා රෙදි විවීම පිළිබඳ පළපුරුදු ඇති සියලු දෙනාම කෑලි පදනම මත ගෙවීම් කිරිමේ පදනම මත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පේෂකර්මාන්ත මධ්‍යස්ථාන වලට අනුයුක්තව සේවය කිරිම සඳහා ඉල්ලුම් කළහැක.

03. **පුරප්පාඩු හා ඉල්ලුම් කරන ක්‍රමය.**

- **පුහුණු උපදේශකවරු.**
  පුරපුපාඩු පවතින පුහුණු පුහුණුකරුවන් ලෙස අනුයුක්තව සේවය කළහැකි මධ්‍යස්ථාන පිළිබඳ විස්තර නැගෙනහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ www.ep.gov.lk/industrialindex.asp යන වෙබ් අඩවිය නිරීක්ෂණය කිරීම තුලින් ඉල්ලුම්කරු කැමැති මධ්‍යස්ථානයක් තෝරාගත හැක.

- රෙදි වියන්නන් ලෙස ඉල්ලුම් කිරීමට කැමැති අය තමන් කැමැති ඕනෑම ජේෂකර්මාන්ත මධ්‍යස්ථානයක් සඳහා තම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළහැක. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියලුම ජේෂකර්මාන්ත මධ්‍යස්ථාන පිළිබඳ විස්තර ඉහත වෙබ් අඩවිය තුලින් ලබාගත හැක.
- ඉහත වෙබ් අඩවිය තුලින් මුද්‍රිත ඉල්ලුම්පත්‍රයක් හෝ ප්‍රධාන කාර්යාලය / අදාල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තු කාර්යාල වලින් ලබාගනු ලබන ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර අදාල ලියකියවිලි වල පිටපත් සහිතව 2017.10.31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියා පදිංචි තැපැල් මගින් එවිය යුතුයි.

**තෝරා ගැනීම හා ගෙවීම.**

- අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය ( Practical exam) මගින් තෝරා ගනු ලැබේ. සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන්නේ නම්, අර්ධකාලින සුදුසුකම් ලබා ඇති අය කෙරෙහි කොන්දේසි පදනම මත සලකා බලනු ලැබේ.
- දෙපාර්තමේන්තුව යටතේ දැනට සේවය කරන හා කලින් සේවය කර ඇති සේවකයින්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

- තෝරා ගනු ලබන පුහුණු පුහුණුකරුවන්ට වැඩ කරන එක් දිනකට රු:1000/= ක් බැගින් දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ.
- රෙදි වියන්නන් සඳහා වූ දීමනාව ඉහත කී වෙබ් අඩවියේ පළකර ඇති චක්‍රලේඛයේ සඳහන් පරිදි කෑලි පදනම මත ගෙවීම් කරනු ලැබේ.
- පුහුණුකරුවන් ලෙස බඳවා ගනු ලබන අයගේ සේවය මාස තුනකට වරක් සේවයේ අවශ්‍යතා මත සේවා කාලය දීර්ඝ කර ලබාදීමේ පදනමක් විය හැක. එසේ වුවද එය අදාල පුහුණුකරුවන්ගේ හැසිරීම, කාර්යක්ෂම සේවාවන් හා නිෂ්පාදන ධාරිතාවය මත දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තනි තීරණය මත දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙන නිර්දේශය මත සිදුවනු ඇත.
- තවද හුදෙක්ම මෙම පත්වීම ස්ථිර පත්වීමක් සඳහා අවශ්‍ය සුදුසුකමක් නොවනු ඇති බව කරුණාවෙන් සලකන්න.

පළාත් අධ්‍යක්ෂ,
ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව
සෙල්වනායගපුරම්, උප්පුවලිය
ත්‍රිකුණාමලය.